# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2008 අංක 39 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 නොවැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 නොවැම්බර් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2008 අංක 39 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2008 නොවැම්බර් මස 07 වන දින]

එල්. ඩී.— ඕ. 10/2008.

## 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2008 අංක 39 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2005 අංක 27 දරන පනතට අලුත් වගන්තියක් ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 1 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 1අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීම.

1අ. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබ තිබිය යුතු ය.

(2) මණ්ඩලය (1) වන උපවගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම ද කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ 1 වන වගන්තියේ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර එම මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය". යන වචන වෙනුවට "මණ්ඩලය සමන්විත විය යුතු වන්නේ:—" යන වචන ආදේශ කිරීමෙන්.

2—PL 003227—3,500 (2008/09)

(2) ඒ වගන්තියේ (iii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:––

"(iii) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නම් කරනු ලබන භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරයට නොඅඩු ධුරයක් දරන නිලධරයකු"; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:––

"මණ්ඩලයේ සංයුතිය".

අතීතයට බලපෑම.

4. මේ පනතේ 1අ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනය සියලු කාර්යයන් සඳහා ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මකවන දින සිට බලාත්මක භාවයට එළඹ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.